# කෝලම් නාටක සන්නිවේදනය

**මනෝරී මනම්පේරී**
**භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***abu _riz@hotmail.com***

කෝලම් නාටක කලාව ශ්‍රී ලංකාවේ දකුණු හා නිරිත දිග මුහුදුබඩ ප්‍රදේශයන්හි දහනව වන සියවස මුල් භාගයේ පමණ ව්‍යාප්ත වූ ප්‍රබල ජන නාට්‍ය කලාවකි. කෝලම් නාටකය පහතරට නර්තන සම්ප්‍රදායට අනුගත ව අභිනය මාර්ගයෙන් රඟ දක්වනු ලැබේ. රජ, බිසව, ආරච්චි, මුදලි, ජස, ලෙන්චිනා, අණබෙර, නොංචි ආදී කෝලම් චරිතත්, යක්‍ෂ, රාක්‍ෂ, සත්ත්ව මනඃකල්පිත චරිතත්, විදේශීය චරිතත්, බෞද්ධ කථා ප්‍රවෘත්තීන් ද අන්තර්ගතයෙන් කෝලම් රංගය නිර්මාණය වී ඇත. මෙම නාටකයෙන් සිදු කෙරෙන සන්නිවේදන කාර්යය සඳහා ඓතිහාසික වැදගත්කමකින් යුතු සුවිශේෂී වෙස් මුහුණු කලාව ද, කවි, ගායන, සංවාද, ශාස්ත්‍රීය බෙර පද, නර්තන චලන ද ආශ්‍රය කරගෙන ඇත.

මෙම පර්යේෂණ කාර්යයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ එකල පැවති යටත් විජිතවාදී වැඩවසම් සමාජ ක්‍රමයේ දුර්වලතා පෙන්වා යහ පාලනය සහ යහ දිවි පැවැත්ම උදෙසා ජනතාව දැනුවත් කිරීමට ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස කෝලම් නාටකය පැවැත්වූයේ ද යන්න සොයා බැලීම යි.

කෝලම් නාටකයේ සිදු කෙරෙන ප්‍රබල සන්නිවේදන කාර්යය පිළිබඳ මෙතෙක් ප්‍රමාණවත් අධ්‍යයනයකට ලක්කර නොමැත. මෙම අධ්‍යයනය මගින් යථෝක්ත ශාස්ත්‍රීය අවකාශය කිසියම් ප්‍රමාණයකට පිරවීමක් සිදුකළ හැකි ය.

මෙම පර්යේෂණ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා කෝලම් නාටකය පිළිබඳ ව මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ ග්‍රන්ථ, පුස්කොළ පොත්, අම්බලන්ගොඩ, මිරිස්ස, අලුත්ගම ආදී කෝලම් නැටුම් කණ්ඩායම් සතු අත්පිටපත් ද, ඔවුන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා ද, කෝලම් නාටක නැරඹීමෙන් ලබා ගත් දත්ත ද, ආශ්‍රය කරගෙන ඇත.

එකල වැඩවසම් සමාජ ක්‍රමයේ පැවති දුර්වලතා පෙන්වා දෙමින් , යහ පාලනයත්, යහ දිවිපැවැත්මත් සකසා ගත යුතු ආකාරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් කෝලම් නාටකය සන්නිවේදන මාධ්‍යයක් ලෙස යොදා ගෙන ඇති බව මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි කරගත හැකි ය.

***ප්‍රමුඛ පද*** *: කෝලම්, නාටකය, සන්නිවේදනය, සමාජය, යහපැවැත්ම*